# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව

## 1994 අංක 2 දරන දකුණු පළාත් සභාවේ මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය.

දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය
(සටහන් කළේ 1994 දෙසැම්බර් මස 02 දින)

දකුණු පළාතේ පළාත් සභාවේ නියමය පරිදි
මුද්‍රණය කරන ලදී.

දකුණු පළාතේ පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලයෙන්
මිළදී ගත හැක.

ගාල්ලේ ආරියදාස මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

මිළ: රු. 7/-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දකුණු පළාතේ පළාත් සභාව

1994 අංක 2 දරණ දකුණු පළාත් සභාවේ
මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය.

මෙම ප්‍රඥප්තිය 1994 නොවැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.

සභාපති
දකුණු පළාත් සභාව

# මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය.

සමහර බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු අයකර ගැනීම සහ දණ්ඩනයන් පැනවීම හා එකතු කිරීම සහ ඊට ආනුෂංගික වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය පහත සඳහන් නීතිවලට අනුකූල වන්නේය:—

1. තෑගී තරහ ආඥාපනත.
2. රාජ්‍ය ඉඩම් ආඥාපනත.
3. වෛද්‍ය ආඥාපනත.
4. ඖෂධ ආඥාපනත.
5. පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත.
6. පඩි හා මිමි ආඥාපනත.
7. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ 1994 අංක 2 දරණ මුදල් (අතිරේක විධිවිධාන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන දිනයක දී මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක විය යුතුය.

## I වන පරිච්ඡේදය.

## තෑගි තරහ බද්ද.

තෑගි තරහ බද්ද.

2. (1) පළාත ඇතුළත ප්‍රවර්ධිත හෝ පවත්වනු ලබන සෑම තෑගි තරහයක් වෙනුවෙන්ම (මෙහි මින් මතු "තෑගිතරහ බද්ද" යනුවෙන් හඳුන්වනු

ලබන) බද්දක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මඟින් නියම කරනු ලබන යම් අනුප්‍රමාණ වලට අනුව පනවා අයකර ගත යුතුය.

මෙම ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා ''තෑගි තරඟය ''යන්නෙන් ද්‍රව්‍ය, මුදල් හෝ සේවාවක්ගෙන් තෑගි පිරිනමනු ලබන තරඟයක් අදහස් කරන නමුත්, ලොතරැයියක් ඊට ඇතුළත් නොවේ.

(2) (අ) පළාත ඇතුළත තෑගි තරඟයක් ප්‍රවර්ධනයට හෝ පැවැත්වීමට අදහස් කරන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා මෙයින් සළසා ඇති විධිවිධානවලට අනුව බලපත්‍රයක් ලබාගත යුතුය.

(ආ) පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අදහස් විමසා පහත සඳහන් කාරණ නියම කරනු ලබන නියෝග අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(I) (2) (අ) ඡේදය යටතේ සඳහන් කරනු ලැබූ බලපත්‍රයෙහි ආකෘතිය හා ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව

(II) මෙම ප්‍රඥප්තිය යටතේ තෑගි තරඟයක් ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කළ හැකි ස්ථානය හෝ පරිශ්‍රය, සහ

(III) එවැනි තෑගි තරඟයක් ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කරන තැනැත්තා විසින් සැපයිය යුතු වාර්තා.

බද්දෙන් නිදහස් කිරීම.

3. පළාත ඇතුළත පුණ්‍ය කටයුතු, අධ්‍යාපනික හෝ ක්‍රීඩා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවර්ධිත වූ හෝ පනවනු ලැබූ යම් තෑගි තරඟයක්, එකඟ වනු ලබන යම් කොන්දේසි වලට යටත්ව,

මෙම ප්‍රඥප්තිය යටතේ අයකර ගත යුතු යම් බද්දකින් නිදහස් කිරීම, අමාත්‍යවරයා විසින් කළ හැකිය.

යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් බලපත්‍රයක් රහිතව ලොතරැයියකට හෝ තෑගි තරඟයකට යොදා ගැනීම වරදකි.

4\. මෙම ප්‍රඥප්තිය යටතේ කලින් බලපත්‍රයක් ලබා නොගත තෑගි තරඟයකට අදාල යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් තබා ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ ගැන දැනිමින්ම යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් තබා ගැනීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දීම හෝ කුලියට දීම කරනු ලබන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතුය. මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසකට නොවැඩි දඩයකින් හෝ තුන් මාසයකට නොවැඩි සරල බන්ධනාගාර ගත කිරීමකින් හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකින්ම හෝ ඔහු දඬුවම් ලැබිය යුතුය.

2 වන වගන්තිය යටතේ වූ නියෝගය පළ කිරීමෙන් මසක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

5\. 2 (I) වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් ඒ අනනුමතයේ දිනයේ සිට, පරිච්ජින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

## II වන පරිච්ඡේදය.

## ඉඩම් සංවර්ධන ආඥාපනත හා රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහාවූ ගාස්තු

ඉඩම් සංවර්ධන ආඥාපනත සහ රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු.

6\. පළාත ඇතුළත පිහිටා ඇති යම් ඉඩමක් සඳහා ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවක් පළාතෙහි පළාත් ආදයම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

## 36: 9 වෛද්‍ය ආඥා පණත යටතේ අය කරනු ලබන ගාස්තු

වෛද්‍ය ආඥා පණත යටතේ අයකරනු ලබන ගාස්තු

7. සාමාන්‍යයෙන් පළාත ඇතුළත නේවාසික වූ යම් තැනැත්තෙකුගෙන් වෛද්‍ය ආඥාපණත යටතේ පනවනු ලැබූ යම් අයකිරීමක්ද ඇතුළුව ඒ යටතේ අයකර ගනු ලබන යම් ගාස්තුවක් එම ආඥා පනත යටතේ එය ලබාගැනීමට බලය ඇති අධිකාරය විසින් හෝ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් එම කාර්ය සඳහා පත්කරනු ලැබූ යම් වෙනත් තැනැත්තකු විසින් අයකරගත යුතුය. එහෙත් කවර අවස්ථාවකදී වූවද එකී ගාස්තු හා අයකිරීම එකී කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළයුතුය.

## 36:5 ඖෂධ හා රසායන ද්‍රව්‍ය සඳහා බලපත්‍ර බද්ද

ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළඳාම වෙනුවෙන් බලපත්‍ර බද්දක්.

8. (1) අමාත්‍යවරයා විසින් ගැසට පත්‍රයෙහි පළ කරනු ලබන නියෝගයක් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණයට හෝ අනුප්‍රමාණවලට අනුව ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළෙන්දකු ලෙස බලපත්‍රයක් ලබාගෙන පළාත තුල ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළඳ ව්‍යාපාරයක යෙදී සිටින සෑම තැනැත්තෙක්ම (මෙහි මින් මතු 'ඖෂධ හා රසායන බද්ද' යනුවෙන් හඳුන්වනු ලබන) බද්දකට යටත් විය යුතුය.

(2) (I) වන උපවගන්තිය යටතේ ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්දකට යටත්වන්නා වූ සෑම තැනැත්තෙක්ම මෙම ප්‍රඥප්තිය බලාත්මක වන්නා වූ දින සිට මාසයක් ඇතුලත ඔහුට ලැබී ඇති බලපත්‍රයෙහි ද පිටපතක් සහිතව ඔහුට සපයනු ලබන යම් ආකෘති පත්‍රයක ඔහුගේ ව්‍යාපාර ස්ථානය පිළිබඳ වාර්තාවක් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පත්කරනු ලැබිය හැකි යම් නිලධරයකුට ඉදිරිපත් කළයුතුය.

(3) [1] වන උපවගන්තිය යටතේ අයකරගත යුතු බදු අනුපාතය බලපත්‍ර ලත් වෙළෙන්ද ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකමට සමානුපාතික විය යුතුය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළයුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක් වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

## IV වන පරිච්ඡේදය

## ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද

9. (1) පතල් ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක හෝ අවසර පත්‍රයක බලය යටතේ පළාත ඇතුළත පිහිටි ඉඩමකින් යම් ද්‍රව්‍ය කැණීමේ, සෙවීමේ, ලබාගැනීමේ හෝ ඉවත්කරගෙන යාමේ අයිතිවාසිකම් ලබාදී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් නියම කරනු ලබන අනුප්‍රමාණයට හෝ අනුප්‍රමාණයන්ට අනුව වූ. [මෙහි මින්මතු 'ඛනිජ බද්ද' යනුවෙන් හඳුන්වනු ලබන] බද්දක් එවැනි තැනැත්තන්ට ලබාදී ඇති අයිතිය මත පළාත් සභාවේ යෝජනා සම්මතයන් මගින් පනවා අයකර ගත හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවනු ලබන ඛනිජ බද්ද බලපත්‍රයෙන් ලබාදී ඇති අයිතිවාසිකම්වලට හා ව්‍යාපාරයේ පිරිවැටුමට සමානුපාතික විය යුතුය.

(3) (1) වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමතිය සඳහා එයට ඉදිරිපත් කළයුතුය. එසේ අනුමත

නොකරනු ලැබූ යම් නියෝගයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරනලද ලෙස සලකණු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද ක්‍රියාවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

## V වන පරිච්ඡේදය

## පඩි හා මිම් ආඥා පණත යටතේ අයකරනු ලබන ගාස්තු

පඩි හා මිම් ආඥාපණත යටතේ ක්‍රමවත් කිරීමේ ගාස්තුව

10. පළාත ඇතුළත පඩි හා මිම් ආඥා පණත යටතේ අයකර ගනු ලබන ක්‍රමවත් කිරීමේ ගාස්තු එම ආඥා පණත යටතේ ඒවා අයකරගනු ලබන බලධරයා විසින් පළාතෙහි පළාත් ආදයම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළයුතුය.

## VI වන පරිච්ඡේදය

## වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපණත යටතේ වූ ගාස්තු

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපණත යටතේ ගාස්තු

11. පළාත් ඇතුළත වූ යම් ප්‍රදේශයක් සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපණත යටතේ අයකර ගනු ලබන ගාස්තු එම ආඥාපණත යටතේ ගාස්තු අයකර ගැනීමට අයිතියක් ඇති බලධරයා විසින් හෝ පළාතෙහි පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින් පත්කරන ලද යම් නිලධරයකු විසින් අයකරගත යුතුය. එහෙත් කවර අවස්ථාවක දී වුවද එකී ගාස්තු පළාතෙහි පළාත් ආදයම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

මෙම ප්‍රඥප්තියෙහි අමතර කරුණු සම්බන්ධයෙනි 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන අදාල විය යුතුය.

12. (1) මෙම ප්‍රඥප්තිය අංක 07 දරණ දකුණු පළාතෙහි මුදල් ප්‍රඥප්තියට අතිරේකයක් වශයෙන් සැලකිය යුතු අතර, එකී මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන පරිපාලනය කරන පළාතෙහි පළාත් ආදයම් කොමසාරිස්වරයා මෙම ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා ද පළාතෙහි පළාත් ආදයම් කොමසාරිස්වරයා විය යුතුය. පළාතෙහි

පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ඔහුගේ සහායකයින්ට පවරා, දෙනු ලබන බලතලවලට අනුව ඔවුන්ට ක්‍රියා කළ හැකිය.

(2) 1990 අංක 07 දරණ මුදල් ප්‍රඥප්තිය යටතේ බදු සහ වෙනත් අයකර ගැනීම් තක්සේරු කිරීමටද ඒ යටතේ අභියාචනයන්ට ද එහි සඳහන් කර ඇති වාර්තා හා දණ්ඩනයන්ට ද අදාල විධිවිධාන, මෙම ප්‍රඥප්තිය යටතේ ද බදු සහ වෙනත් ගාස්තු තක්සේරු කිරීම, වාර්තා දණ්ඩන ආදිය සඳහා ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාලවන අතරම, එම ප්‍රඥප්ති යටතේ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා සතු සියළුම බලතල එකී යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවෙහි විශේෂිතව සඳහන් කර නොමැතිනම්, මෙම ප්‍රඥප්තිය යටතේ ද ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිය.

## VII වන පරිච්ඡේදය

## සාමාන්‍ය

වැරදි හා දණ්ඩන

13. මෙම ප්‍රඥප්තියෙහි යම් විධිවිධානයන් කඩ කරන හෝ ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදුකරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව රුපියල් දහසකට නොවැඩි දඩයකින් හෝ තුන් මාසයකට නොවැඩි සරල බන්ධනාගාරගත කිරීමකින් හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කිරීම යන මේ දෙකින්ම හෝ දඩුවම් ලැබීමකට යටත් වන්නේය.

අර්ථ නිරූපණය

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි—

'අමාත්‍යවරයා' යන්නෙන් පළාතෙහි අමාත්‍ය මණ්ඩලයෙහි මූදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

'පළාත' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි පළාතක් අදහස් වේ.

'පළාත් සභාව' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයෙහි දකුණු පළාතෙහි පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පණතේ සිංහල, සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.